රුහුණ විශ්වවිද්‍යාලය

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණපති උපාධිය

පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2023 ජුනි

**MBM 11043 - නායකත්වය හා පුද්ගල කළමනාකරණය**

මුළු ලකුණු 60
කාලය : පැය තුනයි

ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

---

1.

අ) නායකත්වය (Leadership) සහ බලය (Power) අතර වෙනස පැහැදිළි කරන්න. (ලකුණු 6)

ආ) නායකයින් ඔවුන්ගේ බලය මත යැපෙනු ලැබේ. බලය යෙදීමේ හෝ බලපෑම් උපක්‍රම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

මුළු ලකුනු 12

2.

අ) කාර්ය සාධනය ඇගයීම (Performance Appraisal), කාර්ය සාධන කළමනාකරණයේ (Performance Management) තීරණාත්මක කොටසකි. කාර්ය සාධන ඇගයීම් පද්ධතිය, කළමනාකරණයේ ඉහළ ප්‍රමුඛතාවයක් විය යුත්තේ මන්දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 6)

ආ) සේවක තෝරාගැනීමේ (Employee Selection) මූලික අරමුණ වන්නේ රැකියා සහ සංවිධානය සමඟ පුද්ගලයන් නිසි ලෙස ගැලපීමයි. සේවක තේරීම් වලදී වැදගත් වන මූලික කරුණු තුනක් (සේවක තේරීමේ පරිසරය) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

මුළු ලකුනු 12

3.

අ) වෙනස් වීම නොවැළැක්විය හැකිය. කෙසේ වෙතත්, වෙනසක් අපේක්ෂා නොකළ විට, එය විනාශකාරී විය හැකිය. සැලසුම් නොකළ වෙනස්කම් (Unplanned Change) සමඟ කටයුතු කිරීමේ විධික්‍රම තුනක් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

ආ) කණ්ඩායම් ක්‍රියාත්මක කිරීම බොහෝ නායකයින්ට අභියෝගාත්මක වන සාධක සාකච්ඡා කරන්න?

(ලකුණු 6)

මුළු ලකුනු 12

4.

අ) බහු සංස්කෘතික සංවිධානයක් (multicultural organization) නිර්මාණය කිරීමෙහිලා බලපෑම් කලහැකි සාධක සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර වලංගු කිරීම සඳහා උදාහරණ භාවිතා කරන්න. (ලකුණු 6)

ආ) ඔබ දැනට සේවය කරන හෝ පෙර සේවය කර ඇති ආයතනයක් සන්දර්භය ලෙස ගෙන, "GLOBE" සංස්කෘතික මානයන් හයක් (6) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

මුළු ලකුනු 12

5.

අ) සාර්ථක නායකත්වයට දායක විය හැකි පුද්ගලික ගති ලක්ෂණ (personal traits) හයක් (6) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

ආ) අවශ්‍ය අවස්ථාවලදී උදාහරණ භාවිතා කරමින් "පෞරුෂ ලක්ෂණ පහේ ආකෘතිය" (Big Five Personality Traits Model) සාකච්ඡා කරන්න. (ලකුණු 6)

මුළු ලකුනු 12

@@@@@@@@@@